GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/11/25

# මාධ්‍ය නිවේදනයයි

## මහනුවර ශික්ෂණ රෝහලේ රාත්‍රී සේවයේ යෙදෙන වෛද්‍යවරියන්ට රෝහල් භූමිය තුලදීම හිංසනයට ලක්වීම

23/11/2013 දින රාත්‍රී 12.30ට පමණ රෝගී සේවා අවසන් කර රෝහල් භූමිය තුල පිහිටි නිල නිවාසය වෙත පයින් ගමන් කරමින් සිටි වෛද්‍යවරියකට දරුණු හිරි හැර කිරීමක් යම් පුද්ගලයෙකු විසින් සිදු කර ඇත. එම වෛද්‍යවරිය ඔහු සමග පොර බදා ගැලවී නිල නිවාසයට පැමිණ අන් වෛද්‍යවරුන්ට දැනුම් දෙන තෙක් කිසිවෙක් මෙය නිරීක්ෂණය කර නැත.

මෙවන් සිද්ධියක් විය හැකි බවට අවශ්‍ය පරිසර සාදක රෝහල් භූමිය තුල පවතින බැවින් ඒ සඳහා ආරක්ෂක පියවර යොදවන ලෙස කිහිපවරක් රෝහල් අධ්‍යක්ෂකවරයාගෙන් ඉල්ලීම් කර තිබුණත් එයට වැඩ පිලිවෙලක් නොයෙදීමෙන් මෙවන් අනාරක්ෂිත වාතාවරනයක් රෝහල් භූමිය තුල නිර්මාණය වී ඇත. මෙය සම්පූර්ණයෙන්ම රෝහල් අධ්‍යක්ෂකවරයාගේ අකාර්‍යක්ෂම පරිපාලනය නිසා සිදු වූ අතර උක්ත කරුණ පිළිබඳව පොලිසිය හා රෝහල් පරිපාලනය වෙත පැමිනිලි කර දැනට පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවති.

තවද මෑත කාලයක සිට ආගන්තුක පිරිමින් රෝහල් පරිශ්‍රය තුල පිහිටි සීමාවාසික වෛද්‍ය නිල නිවාස තුලට කිහිපවතාවක්ම ඇතුළුවී පලා ගොස් ඇති බව රෝහල් අධිකාරියට පැමිණිලි කර ඇත.

රාත්‍රී කාලයේ හදිසි රෝගීන්ට ප්‍රතිකාර කරන වෛද්‍යවරුන්ගේ ආරක්ෂාව බරපතල ලෙස අවධානමකට ලක් වී ඇතිබව මෙම සිද්ධිය මඟින් පිළිබිඹු වේ. දිනෙන් දින තත්වය නරක අතට පත්වෙමින් පවති. මෙම අනාරක්ෂිත තත්වය රෝහලේ අනෙකුත් සේවකයන්ටද අදාලය. මෙම තත්ත්වය යටතේ දැනට රෝහලේ රාජකාරී කරන ආරක්ෂක සේවාව පිලිබඳව අපගේ විශ්වාසය සම්පූර්ණයෙන්ම කඩ වී ඇත.

රෝහල තුල රාජකාරී කරන වෛද්‍යවරුන්ගේ ආරක්ෂාව කඩිනමින් තහවුරු කරන ලෙසත් මෙම සාපරාධී ක්‍රියාවල යෙදෙන්නන් සම්බන්ධයෙන් වහාම නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් සෞඛ්‍ය අමාත්‍යංශයේ නිලධාරීන්ගේ සහ රෝහල් පරිපාලනයේ අවධානය වහා යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයේ මහනුවර ශාඛාව 26.11.2013 දින පෙ.ව. 8.00 සිට පැය 24ක සංකේත වැඩ වර්ජනයක් කිරීමට අද දින පැවැත්වූ ශාඛා සංගම් රැස්වීමේදී අනුමත විය.

ස්තූතිය

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය චාමින්ද ගුණතිලක | - | 0717507166 |
| | වෛද්‍ය උපේක්ෂ ලන්සකාර | - | 0716907530 |